# සිනුවර හසුන

## සිඩ්නි සිට ලියමි



තමන් කිසි දිනක නවකතාවක් හෝ වෙනයම් නිර්මාණාත්මක කෘතියක් කියවා නැති බව සුප්‍රකට ඕස්ට්‍රේලියානු දශපන්දු යවන්නෙකු වූ ෂේන් වෝන් මින් කලකට ඉහත පුවත්පත්වලට පවසා තිබුණි.

එය පුදුමවීමට කාරණයක් නොවේ. කියවීමට ඉහල රුචියක් දක්වන්නේ ලොව ජනගහණයෙන් සුළුතරයකි. ඔවුන්ගේ අතේ නිතර පොත පත රැඳේ. දුම්රියේ, බස් රියේ යනෙන විට ද අනෙක් අය නිදිකිරා වැටෙත්දී ඔව්හු පොත්පත් කියවමින් යති. යම් දිනක පොතක් පතක් නොකියවූවොත් ඔවුනට එදින නිදගැනීමට ද නොහැකිය.

ෂේන් වෝන් අයිතිවන්නේ කියවීමට රුචියක් නොදක්වන බහුතරයේ ද, අන්තයේම ඇති -අපිට පොත් අරහං" කොටසට ය. මෙවැන්නෝ කියවීම වැනි බුද්ධිය උත්තේජනය කරන ක්‍රියාවලින් නොව අති සරල විනෝදාංශ මගින් වින්දනය ලැබීමට ප්‍රිය කරති.

ශ්‍රවණාබාධ ඇති අයට කතා කිරීමේ ගැටළු ඇත්තා සේ ම, පොත්පත් නොකියවන අයට ලිවීමේ හැකියාව ලබාගත හැකිවන්නේ ද ඉතා අඩුවෙනි. පොත් නොකියවන ෂේන් වෝන් ගේ -ස්වයං"-චරිතාපදනයේ වෙනත් පුද්ගලයෙකුගේ ද නම සඳහන් වන්නේ එනිසාය. මෙහිදී සිදුවී ඇත්තේ වෝනී තම ජීවිත කතාව කටින් කියද්දී එය සටහන් කරගත් දෙවැන්නා පසුව එම කතාව ලිඛිත භාෂාවෙන් නැවත ලියා සංස්කරණය කරන ලද බව යැයි මම අනුමාන කරමි.

කියවීමට රුචි අයට ලිවීමේ හැකියාව ලැබෙන බව සැබෑමුත් පාඨකයෙකු වූ පමණින් ම ලේඛකයෙකු විය නොහැකිය. ඒ සඳහා බොහෝ ඇසූ පිරූ තැන් හෙවත් අත්දැකීම් මෙන්ම, දැඩි උනන්දුවකුත්, දැඩි අධිෂ්ඨාන ශක්තියකුත්, යම් කිසි කුසලතාවයකුත් අවශ්‍යවේ. පාඨකයින්ට වඩා ලේඛකයින් ගණන ඉතා අඩු ඒ නිසාය. කෙසේවෙතත් ලේඛකයින් නැති කළ පාඨකයින් නොමැත්තා සේම පාඨකයින් නැති කළ ලේඛකයින්ගේ පැවැත්මක් ද නැත.

මේ හැඳින්වීමත් සමග මා මේ සැරසෙන්නේ සිඩ්නි නුවර (සිනුවර) වාසය කරන සිංහල ලේඛකයින් ගැන එක්තරා සුභ ආරංචියක් සන්නස පාඨකයින්ට ගෙන එන්නටයි. එය නම්, මේ 2010 වසරේ සාර්ථක විසිවෙනි වසර සපුරන නිව් සවුත් වේල්සයේ සංස්ථාපිත සිංහල සංස්කෘතික හමුවේ මග පෙන්වීම සහ අනුග්‍රහය යටතේ පසුගිය දිනක වෙස්ට්මීඩ් හි රැස්වුණු සිනුවර වසන ලේඛන කලාවට හිතැති පිරිසක් එකතු වී ලේඛක සංසදයක් (Writers Guild) පිහිටුවා ගත් සුභ ආරංචියයි. මේ සංකල්පය ඉදිරිපත් කරමින් ඒ සඳහා මුල පිරුවේ සිඩ්නි නුවර වෙසෙන සංගීතඥයෙකු, ගායකයෙකු, සමාජ සේවකයෙකු, තිර රචකයෙකු මෙන්ම ටෙලිනාට්‍ය අධ්‍යක්ෂකවරයෙකු ද වන සිසිල් ෆොන්සේකා ය. සිනුවර වසන කෘතහස්ත ලේඛකයින් වන නවකතාකරු සමන් මහානාම දිසානායක ගේ ද, කවියෙකු, කෙටිකතාකරුවෙකු, පුවත්පත් තීරු ලිපි රචකයෙකු මෙන්ම එස්.බී.එස් සිංහල ගුවන් විදුලි වැඩසටහනේ නිෂ්පාදකවරයා ද වන ආචාර්ය පාලිත ගනේවත්ත ගේ ද, පුවත්පත් කලාවේදියෙකු, ප්‍රසිද්ධ ලේඛකයෙකු මෙන්ම සිනමාවේදියෙකු ද වන අනුර හොරේෂස් ගේ ද සහභාගීත්වය මේ ලේඛක සංසදය පිහිටුවීමේ ලා ලැබීම කැපී පෙනෙන සිද්ධියක් විය.

පොදුවේ ඕස්ට්‍රේලියාව තුල සිංහල භාෂාවෙන් කෙරෙන ලේඛන කටයුතු වැඩි දියුණු කිරීමේ සහ ලේඛකයින්ට අතහිත දීම මූලික අරමුණ කරගෙන ඇරඹුණු සිංහල සංස්කෘතික හමුවේ ලේඛක සංසදය සිය මුල් ව්‍යාපෘති ලෙස සිනුවර සිංහල පොත් ප්‍රදර්ශණයක් සහ අළෙවි සල්පිලක් පැවැත්වීමටත්, සිංහල ගී අඩංගු සංයුක්ත තැටියක් නිෂ්පාදනය කිරීමටත් බලාපොරොත්තු වෙති.
පොත් සල්පිලක් පැවත්වීමේ සුභඵල ඉතා පැහැදිලිය. කිලෝ විස්සේ ගමන් මළු තුල රුවා පොත් කිහිපයක් ලංකාවේ සිට ගෙන ඒමෙන් පමණක් සෑහීමකට පත්වෙන්නට මෙතෙක් සිදුවී තිබුණු සිනුවර වෙසෙන දස දහසක් සිංහල ජනතාවට මෙවැන්නකින් ලැබිය හැකි යහපත මිළ කළ නොහේ.

එමෙන්ම, සිංහල ගී සංයුක්ත තැටියක් නිපදවීමේ ව්‍යාපෘතිය මගින් එයට සහභාගී වීමට කැමති ගී රචකයින්, තනු නිර්මාපකයින්, සංගීත සංයෝජකයින් සහ ගායක ගායිකාවන් විශාල ප්‍රමාණකය ගේ කුසලතා එළි දැක්වීමට ද, සිනුවර තුල මහා කලා ප්‍රබෝධයක් ඇති කිරීමට ද හැකි වෙනු ඇත.

මේ ව්‍යාපෘති සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වේවා යැයි සිනුවර ආරච්චිල ඉත සිතින් යුතුව ප්‍රාර්ථනා කරයි. අවසාන වශයෙන් එකක් කිව යුතුය.

සිංහල භාෂාවේ කේන්ද්‍රස්ථානය වූ ශ්‍රී ලංකාවෙන් දුර බැහැරව වෙසෙමින්, දවසේ වැඩි කාලයක් ඉංගිරිසිය අසමින්, ඉංගිරිසියෙන් කතා කරමින්, ඉංගිරිසියෙන් ලියමින් දිවි ගෙවන අපේ සිංහල ලේඛකයින් ට, තමන්ගේ සිංහල ලේඛන කටයුතු වල යෙදීමට ඇති කාලය ඉතා අල්පයක් වනවා සේම ඒ වාතාවරණය යටතේ දිගින් දිගටම සිංහල ලේඛන කාර්යයේ නියලීමට ඇතිකරගත වූ ස්වයං උනන්දුවද අති මහත් වේ.

අපේ ලේඛකයින් ට මේ සංසදවල පරිපාලන කටයුතු සහ ව්‍යාපෘති කටයුත සඳහා මිඩංගු කිරීමට ඇත්තේ ද තම ලේඛන කටයුතු වල යෙදීමට ඇති සීමිත අවකාශමය බව මතක් කරමි.

නිව් සවුත් වේල්සයේ සංස්ථාපිත සිංහල සංස්කෘතික හමුවේ ලේඛක සංසදය යෙහෙ-න් දිනේවා යැයි පතමි.

**සිනුවර ආරච්චිල** <sinuwara.arachchila@gmail.com>

# සිංහල හා දෙමළ අලුත් අවුරුදු චාරිත්‍ර

## 2010 වර්ෂය ඕස්ට්‍රේලියාව

### *නව සඳ බැලීම*

අභිනව චන්ද්‍ර වර්ෂය සඳහා මාර්තු මස 18 වන බ්‍රහස්පතින්දාද, සූර්ය වර්ෂය සඳහා අප්‍රේල් මස 18 වන ඉරිදාද නව සඳ බැලීම සඳහා සුදුසුය.

### *පරණ අවුරුද්ද සඳහා ස්නානයට*

අප්‍රේල් මස 12 වන සඳුදා සුදුසුය

### *අලුත් අවුරුදු උදාව හෙවත් සූර්ය සංක්‍රාන්තිය*

වර්ෂ 2005 අප්‍රෙල් මස 14 වන බදාදා

සිඩ්නි, කැන්බරා, මෙල්බර්න්, බ්‍රිස්බේන් සහ හොබාර්ට් යන නගර වලට පෙරවරු 11 පසු වී විනාඩි 28 ටද,
ඇඩිලේඩ් සහ ඩාවින් යන නගර වලට පෙරවරෙ 10 පසුවී විනාඩි 58 ටද
පර්ත් නගරයට පෙරවරු 09 පසුවී විනාඩි 28 ටද සූර්ය සංක්‍රාන්තිය සිදු වේ.

### *පුණ්‍ය කාලය*

අප්‍රේල් මස 14 වන බදාදා අළුයම සිට, එදින පස්-වරුව දක්වා වන පුණ්‍ය කාලය ඒ ප්‍රදේශ වල සම්මත ඔර්ලෝසු වේලාවෙන්, පහත පරිදි වේ.
සිඩ්නි, කැන්බරා, මෙල්බර්න්, බ්‍රිස්බේන් සහ හොබාර්ට් යන නගර වලට
14 වන බදාදා හිමිදිරි 05.04 සිට 14 දින පස්වරු 05.52 දක්වාද
ඇඩිලේඩ් සහ ඩාවින් යන නගර වලට 14 වන බදාදා හිමිදිරි 04.34 සිට 14 දින පස්වරු 05.22 දක්වාද
පර්ත් නගරයට 14 වන බදාදා හිමිදිරි 03.04 සිට 14 දින පස්වරු 03.52 දක්වාද
පුණ්‍යකාලය බැවින්, පුණ්‍යකාලය ආරම්භ වීමට ප්‍රථම සියලු වැඩ අත්හැර ආගමික වතාවත් වල නියැලීම සුදුසුය.

### *ආහාර පිසීම*

අප්‍රෙල් මස 14 වන බදාදා දින කොල පැහැති වස්ත්‍රාභරණයෙන් සැරසී, ඒ ඒ ප්‍රාන්ත වල සම්මත ඔර්ලෝසු වේලාවෙන් පහත සඳහන් වේලාවනට ආහාර පිසීම සුදුසුය.
සිඩ්නි සවස 05.42 උතුර බලා
කැන්බරා සවස 05.45 උතුර බලා
මෙල්බර්න් සවස 05.58 උතුර බලා
බ්‍රිස්බේන් සවස 05.40 උතුර බලා
හෝබාර්ට් සවස 05.45 උතුර බලා
ඇඩිලේඩ් සවස 05.42 උතුර බලා
ඩාවින් සවස 05.45 උතුර බලා
පර්ත් සවස 05.47 උතුර බලා

### *වැඩ ඇල්ලීම, ගණුදෙනු කිරීම සහ ආහාර අනුභවය*

අප්‍රෙල් මස 14 වන බදාදා කොල පැහැති වස්ත්‍රාභරණයෙන් සැරසී, ඒ ඒ ප්‍රාන්ත වල සම්මත ඔර්ලෝසු වේලාවෙන් පහත සඳහන් වේලාවනට වැඩ ඇල්ලීම, ගණුදෙනු කිරීම සහ ආහාර අනුභවය සුදුසුය.

සිඩ්නි රාත්‍රී 08.15 උතුර බලා
කැන්බරා රාත්‍රී 08.18 උතුර බලා
මෙල්බර්න් රාත්‍රී 08.28 උතුර බලා
බ්‍රිස්බේන් රාත්‍රී 08.25 උතුර බලා
හෝබාර්ට් රාත්‍රී 08.42 උතුර බලා
ඇඩිලේඩ් රාත්‍රී 08.32 උතුර බලා
ඩාවින් රාත්‍රී 08.32 උතුර බලා
පර්ත් රාත්‍රී 08.40 උතුර බලා

### *හිසතෙල් ගෑම*

අප්‍රේල් මස 18 වන ඉරිදා ඒ ඒ ප්‍රාන්ත වල සම්මත ඔර්ලෝසු වේලාවෙන් පහත සඳහන් වේලාවන්හිදී කහ පැහැති වස්ත්‍රාභරණයෙන් සැරසී, උතුර බලා හිස තෙල් ගෑම සුදුසුය.

සිඩ්නි පෙ.ව 11.25
කැන්බරා පෙ.ව 11.38
මෙල්බර්න් දහවල් 12.05
බ්‍රිස්බේන් පෙ.ව 11.05
හෝබාර්ට් දහවල් 12.10
ඇඩිලේඩ් පෙ.ව 11.48
ඩාවින් පෙ.ව 11.32
පර්ත් පෙ.ව 11.42

### *රැකී රක්ෂා සඳහා පිටත්ව යෑම*

අප්‍රෙල් මස 15 වන බ්‍රහස්පතින්දා ඒ ඒ ප්‍රාන්ත වල සම්මත ඔර්ලෝසු වේලාවෙන් පහත සඳහන් වේලාවන් වලට කහ මිශ්‍ර වස්ත්‍රාභරණයෙන් සැරසී, නැගෙනහිර බලා රැකී රක්ෂා සඳහා පිටත්ව යෑම සුදුසුය.

සිඩ්නි පෙ.ව 06.40
කැන්බරා පෙ.ව 06.50
මෙල්බර්න් පෙ.ව 07.10
බ්‍රිස්බේන් පෙ.ව 07.20
හෝබාර්ට් පෙ.ව 07.05
ඇඩිලේඩ් පෙ.ව. 07.00
ඩාවින් පෙ.ව 07.05
පර්ත් පෙ.ව 06.55

ඔබ සැමට සෞභාග්‍යමත් නව වසරක් වේවා

**කේ. හීන්කෙන්ද**
වෛදික ජ්‍යෝතිෂඥ 03 97086480
heen@netspace.net.au

